## රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2006

අංක 1499 සහ 2007.05.25 දනම ගැසට් පත්‍රයේ පළකරන ලද රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියට උසස් කිරීමේ සීමිත තරග විභාගයට අයදුම් පත් කැඳවීමේ නිවේදනයේ අංක 17:IV යටතේ දැක්වෙන ප්‍රශ්න පත්‍රවල ව්‍යුහය පහත පරිදි වන බව විභාග කොමසාරිස් ජනරාල් විසින් මා වෙත දන්වා එවා ඇත.

ප්‍රශ්න පත්‍ර දෙකකි(02).

(1) සාමාන්‍ය දැනීම
(2) අභියෝගතා පරීක්ෂණය

විභාගයේ විෂයයන් පිළිබඳ විස්තර, එක් එක් විෂයයන් සඳහා වෙන් කර ඇති ලකුණු හා කාලය පහත පරිදි වේ.

<u>(1) සාමාන්‍ය දැනීම.</u>

කාලය - පැය දෙකයි(02)
ලකුණු - ලකුණු 100

ප්‍රශ්න පත්‍රය සඳහා වන විෂය නිර්දේශය - ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ සමාජ, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක,දේශපාලන, ආර්ථික හා අදාල වෙනත් කරුණු සම්බන්ධයෙන් (දේශීය හා ජාත්‍යන්තර) වන දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීමට හා ඔවුන් තුළ ලිඛිත භාෂාව හා ලිපි හුවමාරුව පිළිබඳව හැකියාව මැනබැලීම සඳහා වන ප්‍රශ්න වලින් සමන්විත වනු ඇත.

ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

| | | |
|---|---|---|
| I කොටස | බහුවරණ ප්‍රශ්න 40 | (ලකුණු 40) |
| II කොටස | කෙටි පිළිතුරු සඳහා වන ප්‍රශ්න 30 | (ලකුණු 60) |
| | | ලකුණු 100 |

<u>(2) අභියෝගතා පරීක්ෂණය</u>

කාලය - පැය එකයි(01)
ලකුණු - ලකුණු 100

ප්‍රශ්න පත්‍රය සඳහා වන විෂය නිර්දේශය - අපේක්ෂකයාගේ සංඛ්‍යා පිළිබඳ දැනුම, තර්කන හැකියාව සහ සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කළ හැකි වන අයුරින් සකසන ලද ප්‍රශ්න වලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වනු ඇත.

ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය බහුවරණ ප්‍රශ්න 50 (ලකුණු 100)

ඒ.නෝබට්,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,

2007 අගෝස්තු මස 24 වන දින,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.